# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/36 – 2010 ජුනි 03 වැනි බ්‍රහස්පතින්දා – 2010.06.03

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/14/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ආර්. පී. සී. එස්. ජිනදාස මහත්මිය, ඉස්වැටිය, පහල දියදර

සහ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, අංක B 9 හි එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය.

2010 මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/15/14/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. පී. සී. එස්. ජිනදාස මහත්මිය, ඉස්වැටිය, පහල දියදර.

සහ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආර්. පී. සී. එස්. ජිනදාස මහත්මිය එහි පරිපාලන නිලධාරී තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා පත් කර එලෙස එම තනතුරෙහි රාජකාරි ඉටු කරමින් සිටියදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වෙනත් නිලධාරියෙකු පරිපාලන නිලධාරී තනතුර සඳහා පත්කර ගැනීම හේතුවෙන්, ඇයට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ආර්. පී. සී. එස්. ජිනදාස මහත්මියට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 මැයි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

06 - 375

---

මගේ අංකය: IR/14/05/2007.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

සී. වික්‍රමසිංහ මහතා, අංක 68, වෙලගෙදර, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, රජ මාවත, අංක 101 B හි ලොයිඩ් ගල්හේන මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය.

2010 මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/14/05/2007.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

සී. වික්‍රමසිංහ මහතා, අංක 68, වෙලගෙදර, බදුල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

(1) එවකට සීමාසහිත ඌව බස් සමාගම යටතේ පාලනය වූ මොණරාගල ඩිපෝවේ III-A ශ්‍රේණියේ නිලධාරී වශයෙන් සේවයේ යෙදී සිටි සී. වික්‍රමසිංහ මහතා වෙත පවත්නා විනය ව්‍යවස්ථාවට පටහැනිව සමාගමේ බලය නොමැති නිලධාරියෙකු වූ බදුල්ල ඩිපෝවේ ඩිපෝ කළමනාකරු විසින් 2005.02.21 දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කිරීම කළා යයි දැක්වීම නිවරැදි ද යන්න හා නිවැරදි වේ නම් ඔහුට කුමන සහනයක් ලැබිය යුතු ද යන්න හා

(2) එම චෝදනා පත්‍රය මත එවකට සීමාසහිත ඌව බස් සමාගමේ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරී විසින් 2005.06.23 දිනැති විනය නියෝගය මගින් 2005.02.07 දින සිට ඉදිරියට මාස හයක කාලසීමාවක් සඳහා වේතන රහිතව තාවකාලිකව සී. වික්‍රමසිංහ මහතාගේ සේවය අත්හිටුවීම යුක්තිසහගත ද යන්න හා යුක්තිසහගත නොවේ නම්, ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න හා

(3) ඉන් අනතුරුව සීමාසහිත ඌව බස් සමාගමේ අභියාචනා මණ්ඩල සභාපති විසින් එම සමාගමේ III-A ශ්‍රේණියේ නිලධාරී සී. වික්‍රමසිංහ මහතා වෙත නිකුත් කරනු ලැබූ 2005.09.29 දිනැති අභියාචනා නියෝගය මගින් 2005.10.03 දින සිට 2006.02.02 දින දක්වා ඔහුගේ සේවය වේතන රහිතව මාස හතරකට තාවකාලිකව අත්හිටුවීම මගින් දී තිබූ දඬුවම් කාලය වැඩි කර තිබේද, තිබේ නම් එය යුක්තිසහගත ද යන්න හා යුක්ති සහගත නොවේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න හා

(4) සී. වික්‍රමසිංහ මහතාට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය ඉවත් කරන ලෙසට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරී විසින් එහි සභාපති වෙත කරනු ලැබූ නිර්දේශය නොසලකා හැරීම හේතුවෙන් සමස්ථ ලෙස ගත් කල සී. වික්‍රමසිංහ මහතාට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2010 මැයි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදි දින යොදන ලදී.

06 - 376

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.